# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
2015 මාර්තු - මැයි

**සමාජීය විද්‍යා පීඨය**

ආර්ථික විද්‍යාව - **ECON- E 2015**

**සූක්ෂ්ම ආර්ථික විද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

ප්‍රස්ථාර කොල සපයනු ලැබේ.

---

01. i. උපයෝගීතා ශ්‍රිතය යන්නෙන් වැටහෙන්නේ කුමක් ද? (ලකුණු 05)

ii. පරිභෝජක හැසිරීම පිළිබඳ ආන්තික උපයෝගීතා න්‍යායේ භාවිත උපකල්පන විස්තර කරන්න. (ලකුණු 07)

iii. ආන්තික උපයෝගීතා න්‍යායේ දී ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. i. උපේක්ෂා වක්‍රය අර්ථ දක්වා තාර්කික පරිභෝජකයෙකුගේ උපේක්ෂා වක්‍රවල ගති ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05)

ii. 'ආන්තික උපයෝගීතා න්‍යාය හා සසඳන විට උපේක්ෂා වක්‍ර විග්‍රහය පරිභෝජක හැසිරීම පිළිබඳ න්‍යායේ වර්ධනාත්මක පියවරකි .' මේ ප්‍රකාශය හා එකඟ වන්නේ ද? විස්තර කරන්න. (ලකුණු 12)

03. i. 'ආදායම් පරිභෝජන වක්‍රය' අර්ථ දක්වා එය ඇසුරින් එංගල් වක්‍රය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 10)

ii. භාණ්ඩයක මිල වෙනස්වීමේ 'ආදායම් ප්‍රතිවිපාකය' හා 'ආදේශන ප්‍රතිවිපාකය' යෝග්‍ය උදාහරණ භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 10)

04. i. කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 07)

ii. විචල්‍ය සාධක අනුපාත නියමය විස්තර කර එය ප්‍රස්ථාරිකව නිරූපනය කරන්න. (ලකුණු 07)

iii. පරිමානානුකූල ඵල පිළිබඳ නීති විස්තර කරන්න. (ලකුණු 06)

05. i. සමනිෂ්පාදිත වක්‍රය අර්ථ දක්වන්න. (ලකුණු 06)

ii. තාර්කික නිෂ්පාදකයෙකුගේ සමනිෂ්පාදිත වක්‍රවල ගති ලක්ෂණ මොනවාද? (ලකුණු 06)

iii. සමනිෂ්පාදිත වක්‍ර විශ්ලේෂණය මත පදනම්ව තාර්කික නිෂ්පාදකයකුගේ සමතුලිත කොන්දේසි ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 08)

06. i. නිෂ්පාදනයේ මුළු ස්ථාවර පිරිවැය (TFC), මුළු විචල්‍ය පිරිවැය (TVC) හා මුළු පිරිවැය (TC) යන සංකල්ප විස්තර කර එකම සටහනක ඒවා ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 10)

ii. පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය ද? අසත්‍ය ද? යන්න විස්තර කරන්න.

අ) ව්‍යාපාරයක හිමිකරුවකු වැටුප් ලබා නොගනී. එනිසා එහි ගණකාධිකරණ පිරිවැය ශුන්‍ය වුව ද ආර්ථික පිරිවැය ධන වේ. (ලකුණු 05)

ආ) ආයතනයක් විසින් සේවා වියුක්තව සිටින පුද්ගලයකු සේවයට බඳවා ගනී. ඔහුගේ සේවා උපයෝජනයේ ආවස්ථික පිරිවැය ශුන්‍ය වේ. (ලකුණු 05)

07. i. ඒකාධිකාරියකු 'මිල සාදන්නකු'වන අතර පූර්ණ තරඟකාරී ආයතනයක් 'මිල ගනුවකු' වේ. මේ තත්ත්වයන් න්‍යායාත්මක හේතු පදනම් කර ගනිමින් විස්තර කරන්න. (ලකුණු 08)

ii. මිල විශේෂණය යන්නෙන් කුමක් අදහස් වේ ද? විස්තර කරන්න. (ලකුණු 07)

iii. පූර්ණ තරඟකාරී ආයතනයකට මේ අලෙවි උපක්‍රමය අනුගමනය කළ නොහැක්කේ ඇයි ? (ලකුණු 05)

08. i. ඒකාධිකාරී තරඟයේ උපකල්පන විස්තර කරන්න. (ලකුණු 05)

ii. ඒකාධිකාරී තරඟ ආයතනයක ඉල්ලුම් වක්‍රයේ හැඩය දැඩි නම්‍ය ස්වරූපයක් ගන්නේ ඇයි ? (ලකුණු 05)

iii. ඒකාධිකාරී තරඟ ආයතනයක දිගුකාලීන සමතුලිතය ප්‍රස්ථාර භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 10)

09. i. කතිපයාධිකාරී වෙළඳපොල ආකෘතියේ උපකල්පන විස්තර කරන්න. (ලකුණු 05)

ii. කතිපයාධිකාරයේ අන්‍යෝන්‍ය රැඳියාව හා ප්‍රතිවාදීත්වය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. ප්‍රචාරණය පරිභෝජකයන් සඳහා සහ ආර්ථිකය සඳහා හොඳ ද ? නරක ද? එසේ වන්නේ ඇයි ? (ලකුණු 08)

10. පහත දැක්වෙන සංකල්ප සසඳන්න.

i. යථානුරූපී ආර්ථික විද්‍යාව හා අභිමතානුරූපී ආර්ථික විද්‍යාව (ලකුණු 06)

ii. සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව (ලකුණු 07)

iii. කේන්ද්‍රාපසාරී පාතෝත්පාතන හා කේන්ද්‍රාභිසාරී පාතෝත්පාතන (ලකුණු 07)

****************************